**වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2024**

------------------------------------------------------------------------------------------------------------

වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2018 අංක 32 දරණ වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පිළිබඳ පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන අධිකාරියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග ඉදිරිපත් කරන ලද මෙහෙයුම් අත්පොතේ ඡේද අංක 6.6 පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 1315 ක් ප්‍රමාදව එනම් 2025 ඔක්තොම්බර් 07 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු අතර 2022, 2023 හා 2024 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා 2025 ඔක්තෝබර් 27 දින වන විටද විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වෙමි. අධිකාරිය සඳහා ස්ථිර ගණකාධිකාරවරයෙකු හෝ සහය කාර්යමණ්ඩලයක් නොමැතිවීම නිසා මෙම ප්‍රමාදවීම් සිදු වී ඇත. 2024 වර්ෂයේ සැප්තැම්බර් සිට 2025 ජුනි දක්වා අධිකාරිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය පත් කර නොතිබීම හේතුවෙන් 2021 මූල්‍ය වාර්තාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවස්ථාවක් ලැබුණේ 2025.08.29 දින වේ.2021 වර්ෂයට අදාළ මූල්‍ය වාර්තාව 2025 ඔක්තෝබර් 03 දින විගණනයට ඉදිරිපත් කර ඇත. 2022 මූල්‍ය වාර්තාවට | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දින වලදී මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

2025.09.30 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

## 2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 32 දරණ වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පිළිබඳ පනත | | | |
| | (i) 20 (i) ඡේදය | අධිකාරියට එහිම අරමුදලක් තිබිය යුතු වුවද 2025 ඔක්තෝබර් 07 දින වන විටත් අධිකාරිය සඳහා අරමුදලක් පිහිටුවා නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ලබාගෙන අරමුදලක් පිහිටුවීමට කටයුතු කරමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව අධිකාරිය සඳහා අරමුදලක් පිහිටුවීමට කටයුතු කළ යුතු වේ. |
| | (ii) 22 (2) හා (3) ඡේද | නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාම හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ගිණුම් පිළියෙල කළයුතු අතර ගිණුම්කරණය පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව අත්තිකාරම් ලේඛණ හා ස්ථාවර වත්කම් ලේඛණය පිළියෙල කිරිම සිදුකර නොතිබුණි. | අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටිය 2020 දෙසැම්බර් වනවිට අනුමත කරගත් නමුත් අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අවස්ථාවක් ලබා දී නොමැත. 2023 වර්ෂයේ දී ලබාගත් විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් යටතේ 2024 වර්ෂයේ සිට ගණකාධිකාරවරයෙකු ස්ථිරව බඳවාගෙන නිසි පරිදි ලේඛන ගත කිරීම් සිදු කිරීමට කටයුතු යොදා ඇත. මේ වනවිට අත්තිකාරම් ලේඛන හා ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි පිළියෙල කිරීමට කටයුතු යොදා ඇත. | අත්තිකාරම් ලේඛන හා ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි

| | | | | |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 371 (2) (ආ) | මාණ්ඩලික නිලධාරීන්ට පමණක් තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය යුතු වුවත් මාණ්ඩලික නොවන නිලධාරියෙකුට 2024 පෙබරවාරි 06 සිට මැයි 14 දක්වා කාල සීමාව තුල දී අවස්ථා 06 ක දී රු.364,000 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | එකඟවෙමි. මාණ්ඩලික නිලධාරීන් සඳහා පමණක් තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දීමට හැකි සෑම අවස්ථාවකදීම කටයුතු කර ඇත. එසේ වුවද අධිකාරිය විසින් සිදුකරන සංවර්ධන කාර්යයන් සඳහා අවස්ථානුකූලව එක් මාණ්ඩලික නිලධාරියෙකු හරහා ලබා ගන්නා අත්තිකාරම් මුදල ප්‍රමාණවත් නොවන අවස්ථාවක අධිකාරිය සතුව මාණ්ඩලික නිලධාරීන් නොමැති වීම මත මාණ්ඩලික නොවන ස්ථිර පත්වීම්ලාභී නිලධාරියෙකුට එසේ අත්තිකාරම් මුදල් ලබා ගැනීම සඳහා විශේෂ අනුමැතියක් දී ඇත. මේවන විට මාණ්ඩලික නිලධාරීන් 05 දෙනෙකු (වැඩබැලීම් 03, ස්ථිර 02) අධිකාරියේ ඇති බැවින් එවැනි ගැටළුවක් ඇති නොවේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | මුදල් රෙගුලාසි 371 (5) | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාගත් පසු අදාල කාර්යය අවසන් කර දින 10 ක් තුළ පියවිය යුතු වුවත් 2024 වර්ෂයේ පෙබරවාරි සිට අප්‍රේල් දක්වා නිලධාරීන් 04 දෙනෙකු විසින් අවස්ථා 08 ක දී ලබාගත් රු.702,000ක අත්තිකාරම් අදාල කාර්යය අවසන්වී දින 10 ක් තුළ පියවා නොතිබුණි. | එකඟවෙමි. අදාළ කාල සීමාව තුළ අධිකාරිය විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ එක්ව නුවරඑළිය, මහනුවර, මාතලේ හා බදුල්ල දිස්ත්‍රික්කයන් හී ඔප්පු සකස් කිරීමේ කඩිනම් වැඩ පිළිවෙල යටතේ එක දිගට දින කිහිපයක් (දින 03 – 05 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | දක්වා) ස්ථාන කිහිපයක ඔප්පු සකස් කිරීමේ මූලික කටයුතු සිදු කරන ලදී. අත්තිකාරම් මුදල් වියදම් කිරීම එම නිලධාරී කණ්ඩායම් මඟින් සිදු වූ බැවින් දින 10 ක් තුළ බිල්පත් පියවීම සඳහා අදාළ බිල්පත් ලබා ගැනීම ප්‍රායෝගික දුෂ්කරතාවයක් මතුවූ බැවින් මෙම ප්‍රමාදය සිදුවී ඇත. මෙය හුදෙක් එම කාර්ය ඉටු කිරීමේ සංකීර්ණත්වය මත සිදුවූවකි. | |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) | 4.2.1 ඡේදය | අධිකාරිය විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවත් 2022 - 2024 වර්ෂ සඳහා එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි | පිළිගනිමි. මේ වන විට එය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය. |
| (ii) | 4.2.2 (ආ) ඡේදය | ප්‍රසම්පාදන කාල සටහනක් සකසා නිසි කළමනාකරණයක්ද සිදුකළ යුතු වුවත් එවැනි ප්‍රසම්පාදන කාල සටහනක් අධිකාරිය විසින් 2022 - 2024 වර්ෂ වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි. | පිළිගනිමි.<br>මේවන විට සකස් කිරීමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙළ කළ යුතුය. |
| (iii) | 4.3.1 ඡේදය | 2022, 2023 හා 2024 වර්ෂ වෙනුවෙන් මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙළ කර අනුමත කරගෙන නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේදි කටයුතු කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 අංක 32 දරණ වැව්ලි කලාප සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පනතේ 35 වන වගන්තිය ප්‍රකාරව අධිකාරියේ රැස්වීම් හා එම රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම හා සම්බන්ධ වෙනත් යම් කාරණා සඳහා රීති සකස් කිරීමට අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයට හැකියාව තිබුණද එවැනි රීති සකස් කිරීමක් සිදුකර නොතිබුණි. | පනත මගින් බලය ලබා දී ඇති පරිදි අධිකාරිය සඳහා විශේෂිත රීති සකස් කිරීම විශේෂ අවශ්‍යතාවන් මෙතෙක් මතු නොවූ බැවින් මේ දක්වා විශේෂ රීති සකස්කර ගැසට් මගින් ප්‍රකාශයට පත්කර නොමැත. එසේ නමුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම පූර්ව එකඟතාවයකින් පිළිගත් සම්ප්‍රදායන් මත සිදු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර එහි උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | පනත ප්‍රකාරව අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම හා සම්බන්ධ වෙනත් යම් කාරණා සඳහා රීති සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාරවල ආයතනික පාලනය සඳහා වන මාර්ගෝපදේශයේ 2.2.2 (a) (ii) අනුව අවම වශයෙන් මසකට වරක් පනතේ ක්‍රමවේදයන් අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු වුවද 2024 වර්ෂය තුල දී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 06 ක් පමණක් පවත්වා තිබුණි. | එකඟ වෙමි. 2024 සැප්තැම්බර් මස සිට අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා ඇත. නව අධ්‍යක්ෂ මණ්ඩලය 2025 ජුනි මස පත්කර ඇත. 2024 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පැවතියේ මාස 08 ක් පමණ වන අතර, එම කාලයට අදාළව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 06 ක් පවත්වා ඇත. | චක්‍රලේඛය හා මාර්ගෝපදේශ ප්‍රකාරව අවම වශයෙන් මසකට වරක් අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුලදී දරා තිබූ එකතුව රු.14,380,622ක් වූ මුළු වියදමින් අධිකාරිය වෙත පැවරුණු කාර්යයන් සඳහා වැය කර තිබුණේ රු.1,437,126 ක වියදමක් පමණි. එය මුළු වියදමින් සියයට 10 ක් තරම් අවම මට්ටමක පැවතුණි. | අධිකාරියේ කාර්යභාරයක් වන වැව්ලි කලාපයේ සංවර්ධනය ඉලක්ක කරගත් කාර්යභාරයන් සඳහා අධිකාරිය වෙත වෙන්වූ වැය විෂයයක් හෝ සෘජුව | අධිකාරිය වෙත පැවරුණු කාර්යයන් ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රතිපාදන ලබාදීමක් සිදුවී නොමැත. එම නිසා අධිකාරිය මඟින් සිදුවූ සංවර්ධන කාර්යයන් සඳහා දරණ ලද වියදම් අදාළ ප්‍රතිපාදන වෙන්වූ ආයතනයන්හි වැය විෂයයන් යටතේ සටහන් කර ඇත. අධිකාරිය වෙත සෘජුව සංවර්ධන කාර්යයන් සඳහා වැය විෂයයන් වෙන් නොවීම හෝ ප්‍රතිපාදන නොලැබීම මත මෙම ගැටළුව පැන නැගී ඇති බවත් එය අධිකාරියේ කාර්යසාධනයට සෘජුව බලපාන බවත් අදාළ පාර්ශවයන් වෙත දැනුම් දී ඇත. | |
| (ආ) | අමාත්‍යාංශය විසින් විවිධ යෝජනා ක්‍රම යටතේ ඉදිකරනු ලබන නිවාස සඳහා ඔප්පු ලබාදීම අධිකාරිය විසින් සිදුකරනු ලබන අතර අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ඉන්දියානු ආධාර නිවාස ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා රජයේ ණය ආධාර මත සිදුකර ඇති නිවාස ව්‍යාපෘතිය, සහ ආපදා නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදිකළ නිවාස පිළිබඳ තොරතුරු ඔප්පු ලබාදීම සඳහා අධිකාරය වෙත ලබා දී නොතිබුණි. | එකඟ වෙමි. | අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණයෙන් යුතුව නම් කළ ප්‍රදේශවල ඇති නිවාසවල නීත්‍යානුකූල පදිංචිකරුවන්ට එම නිවාසවල අයිතිය ප්‍රදානය කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 සහ 2023 වර්ෂවල දී ඉන්දියානු ආධාර මත ආරම්භ කළ නිවාස 4,000 ක් හා නිවාස 1,300 ක් ඉදිකිරීමේ ව්‍යාපෘති යටතේ, ඉදිකර අවසන් වූ නිවාස සඳහා හිමිකම් ඔප්පු ලබාදීමට අවශ්‍ය පහසුකම් සැලසීම 2024 වර්ෂයේ අධිකාරිය විසින් ආරම්භ කර තිබුණු අතර මාතලේ, නුවරඑළිය, බදුල්ල, මහනුවර යන දිස්ත්‍රික් 04හි ඉදිකළ නිවාස 1,081ක් සඳහා ඔප්පු සකස් කර තිබුණ ද 2025 සැප්තැම්බර් 10 දින වන විට ඔප්පු 737 ක් පමණක් බෙදා දී තිබුණි. | ඔප්පු සකස් කළද, 2024 සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා මැතිවරණ ප්‍රකාශයට පත්කිරීම හේතුවෙන් මැතිවරණ චක්‍රලේඛ වලට අනුකූලව ඔප්පු බෙදා දීමට අවකාශ ලැබී නොමැත. එම නිසා මෙම ප්‍රමාදය සිදු වී ඇත. | සකස් කළ ඔප්පු ප්‍රමාදයකින් තොරව ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මහනුවර දිස්ත්‍රික්කයේ ඉදිකළ නිවාස 47ක නිවාසවල ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණද පිඹුරුපත්වල අඩුපාඩු පැවතීම මත හිමිකම් ඔප්පු ලබාදීමට නොහැකි වී තිබුණි. තවද බදුල්ල | මහනුවර දිස්ත්‍රික්කයේ ඔප්පු 47 පිඹුරුවල අඩුපාඩු සකස් කර ලබාදීමට කටයුතු කිරීමට සැලසුම් කර ඇත. | පිඹුරුපත්වල අඩුපාඩු සකස් කර නිශ්චිත නිර්ණායක සම්පූර්ණ කළ අයදුම්කරුවන්ට |

| | | | |
|---|---|---|---|
| | දිස්ත්‍රික්කයේ ඉදිකළ නිවාස 234 සඳහා හිමිකම් ඔප්පු සකස් කර තිබුණද ඒවා බෙදාදීමට 2025 සැප්තැම්බර් 10 දින වන විටත් කටයුතු කර නොතිබූ අතර ලැයින් කාමර ආපසු භාර නොදීම මත හිමිකම් ඔප්පු 44ක් ද , ඔප්පු ලබාගැනීමට නොපැමිණීම මත හිමිකම් ඔප්පු 19ක් ද අධිකාරිය භාරයේ තව දුරටත් පැවතුණි. | 2024 අගෝස්තු මස ජනාධිපතිවරණය හා ඉන් අනතුරුව මහ මැතිවරණය ගැසට්කිරීම නිසා ඔප්පු සකස් කළ ද බදුල්ල දිස්ත්‍රික්කයේ ඔප්පු 234 බෙදාදීමට අවස්ථාවක් නොලැබිණි. මාතලේ හා මහනුවර දිස්ත්‍රික්කයේ අධිකාරිය රඳවා ගෙන ඇති ඔප්පු ඒවා ලබාදීමට අවශ්‍ය මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසු ලබාදීමට නියමිතව ඇත. | ඔප්පු ලබාදීමට කටයුතු කළ යුතුය |
| (ඉ) | රජයේ ප්‍රතිපාදන යටතේ ඉදිකළ නිවාස සඳහා රජය විසින් දරණ ලද පිරිවැයෙන් කොටසක් නිවාස හිමිකරුගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණි. අමාත්‍යාංශය විසින් එම ණය ගෙවා අවසන් වූ හිමිකරුවන් පිළිබඳ තොරතුරු අධිකාරිය වෙත ලබා නොදීම හේතුවෙන් අධිකාරිය විසින් රජයේ ප්‍රතිපාදන යටතේ ඉදිකළ නිවාස සඳහා ඔප්පු සකස් කර නොතිබුණි. තවද ඉදිකිරීම් අවසන් කරන ලද නිවාස සඳහා හිමිකම් ඔප්පු ලබාදීමට අවශ්‍ය තොරතුරු අධිකාරිය වෙත ලැබී නොතිබීම මෙන්ම වතු අධිකාරිය එම ඉඩම් කොටස් නිදහස් කිරීමට අකමැති වීම, ඉදිකරන ලද නිවාස වලට අයත් භූමිය වෙන්කිරීමට යාමේ දී ප්‍රායෝගික ගැටලු හේතුවෙන් මෙම ක්‍රියාවලිය මන්දගාමී වී තිබුණි. | විගණනය පෙන්වා දි ඇති පරිදි අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත තොරතුරු ලබාදීමේ ඇති ගැටළු මගහරවා ගැනීම සඳහා අධිකාරිය මගින් අදාළ දත්ත සමීක්ෂණ පවත්වා අධිකාරියේ කාර්ය භාරය ප්‍රශස්ථව ඉටු කිරීම සඳහා සැලසුම් සකස් කරමින් පවතින අතර ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා මානව සම්පත් ලබා ගැනීමට කටයුතු කරමින් පවති. ඒ අනුව ඉදිරියේදී එම ගැටළුව මගහරවා ගැනීමට හැකිවනු ඇත. | නිවාස සඳහා හිමිකම් ඔප්පු ලබාදීමේ ක්‍රියාවලිය නියමිත දිනවලදී අවසන් කළ යුතුය. |
| (ඊ) | නම්කල ප්‍රදේශවල වතු අංශයේ සිටින තරුණ ප්‍රජාවට ඔවුන්ගේ අධ්‍යාපනික සංවර්ධනය සඳහා තෘතියික හා උසස් අධ්‍යාපන ආයතන වලට ඇතුළත්වීම සඳහා සහාය සැලසීම අධිකාරියේ එක් කාර්යයක් වුවද 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුමේ ඒ පිළිබඳ ක්‍රියාකාරකම් ඇතුළත් කර නොතිබුණු අතර 2023 වර්ෂයේ පමණක් එම කාර්යය ඉටුකර තිබුණි. | අධිකාරිය සඳහා සංවර්ධන වැය විෂයක් වෙන් කර නොතිබුණ බැවින් අධිකාරියේ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට ප්‍රතිපාදන ලබා දෙන ආයතනයන් හි ප්‍රමුඛතාව මත සිදුවේ. නමුත් 2024 වර්ෂයේ අමාත්‍යාංශය මගින් ඒ සඳහා ප්‍රමුඛතාවය දී ප්‍රතිපාදන වෙන්කර නොතිබු බැවින් 2024 වර්ෂයට එහි ක්‍රියාකාරීත්වය ඇතුලත් කර නොමැත. | අධිකාරියේ කාර්යභාරයන් ක්‍රියාකාරී සැලසුමට ඇතුලත් කර එම ඉලක්ක ලබා කර ගැනිමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | 2018 ඔක්තෝම්බර් මස 04 දිනැති 2018 අංක 32 දරණ පාර්ලිමේන්තු පනත මගින් වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පිහිටුවා ඇති අතර පනතේ 6 වන වගන්තිය අනුව අධිකාරිය විසින් ඉටු කළ යුතු කාර්යයන් ආවරණය වන පරිදි ආයතනයේ ක්‍රියාකාරකම් හා කටයුතු සැලසුම් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | නිලධාරීන් 28 දෙනෙකුගෙන් සමන්විත අනුමත කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය බඳවා ගැනීම් පටිපාටිය අනුමත කර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර ඇත. එසේ නමුත් අනුමත ස්ථිර කාර්යමණ්ඩලය බඳවා ගැනීම සඳහා අවස්ථාවක් ලබා නොදීමත්, සංවර්ධන කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රතිපාදන ලබා නොදීමත්, හේතුවෙන් පනතේ සඳහන් සියලු කාරණා ඉටු කිරීමට නොහැකි වූ බව පිළිගනිමි. | පනත මගින් අධිකාරිය වෙත පැවරුණු කාර්යයන් ඉටුකිරීමට අදාල කාර්යයන් සැලසුම් කර ඒ අනුව කටයුතු කළ යුතුය. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක DMS/1849 දරණ 2019 අගොස්තු 15 දිනැති ලිපියෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අධිකාරියේ අනුමත තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් 28 පත් කළයුතු වුවත් 2024 දෙසැම්බර් 31 දින වන විට අධිකාරියේ තනතුරු 03 ක් සඳහා ස්ථිර පත්වීම් 04 ක් පමණක් සිදුකර තිබුණි. අනෙක් කාර්ය මණ්ඩල නිලධාරීන් 08 දෙනා වැඩ බැලීමේ, කොන්ත්‍රාත් සහ ද්විතික පදනම් යටතේ සේවය කරනු ලබන බව නිරීක්ෂණය විය. මේ අනුව එදිනට ආයතනය තුළ පුරප්පාඩු 16 ක් පැවතුණි. 2025 අගොස්තු 31 දින වන විට කාර්ය මණ්ඩලය 10 ක් දක්වා අඩු වී මෙම තත්ත්වය තවදුරටත් අයහපත් වීමෙන් ආයතනයේ අපේක්ෂිත අරමුණු හා කාර්යයන් ඉටුකරගැනීමට අහිතකර ලෙස බලපා තිබෙන බව නිරීක්ෂණය විය. | මේ පිළිබඳ දීර්ඝ කාලයක් තිස්සේ අදාළ අංශ සහ නිලධාරීන් දැනුවත් කර ස්ථිර බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කළද ප්‍රතිඵලයක් ලැබී නොමැති බැවින් අධිකාරියේ අපේක්ෂිත කාර්යයන් ඉටුකිරීම ප්‍රමුඛතාවය ලෙස සලකා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ තාවකාලික පියවරයන් ලෙස අවශ්‍ය බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | අනුමත කර ඇති ස්ථිර තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.** **මෙහෙයුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **සංයුක්ත සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග ඉදිරිපත් කරන ලද | පිළිගනිමි. 2021-2025 වර්ෂයන් සඳහා සංයුක්ත | චක්‍රලේඛය ප්‍රකාරව මෙම සැලසුම් |

| | | | |
|---|---|---|---|
| | රාජ්‍ය ව්‍යාපාරවල ආයතනික පාලනය සඳහා වන මාර්ගෝපදේශයේ 2.3 වගන්තිය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය ලේඛනය සමග පිළියෙල කළ උපායමාර්ගික සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසු ලේකම්, රේඛීය අමාත්‍යාංශය, අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2021-2025 වර්ෂ සඳහා උපායමාර්ගික සැලැස්ම අදාල පාර්ශවයන් වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද ව්‍යාපාර පරිසරයේ සිදුවන වෙනස්වීම්වලට අනුව වර්ෂයෙන් වර්ෂය අදාල සංශෝධනයන් ඇතුලත් කරමින් සංයුක්ත සැලැසුම් සකස් කර අදාල වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීමට කටයුතු වුවද අදාල සංයුක්ත සැලැස්ම සංශෝධනය කර ඉදිරිපත් කර නොතිබුණි. | සැලැස්ම සකස් කර ඇති අතර 2021 වර්ෂයට අදාළ ක්‍රියාකාරකම් ඉටු කිරීමට ප්‍රතිපාදන වෙන්වීමක් සිදු නොවූ බැවින් හා එම කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කාර්ය මණ්ඩලයක් නොසිටි බැවින් එය එසේ යාවත්කාලින කිරීම ප්‍රායෝගිකව සිදු නොවූ බැවින් සංයුක්ත සැලැස්ම චක්‍රියව ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් උදාවී නොමැත. විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි 2024 වර්ෂයේ සිට ඉදිරියට සංයුක්ත සැලැස්ම සකස් කර ඇත. | ගිණුම් වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | අධිකාරිය විසින් 2021-2025 වර්ෂ ආවරණය වන පරිදි පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්මෙහි 2018 අංක 32 දරණ වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරී පනතේ 4 ඡේදය ප්‍රකාරව අධිකාරියේ අරමුණු සහ පනතේ 6 ඡේදය ප්‍රකාරව අධිකාරියේ කාර්යයන් ආවරණය වන පරිදි සහ එම කාර්යයන් ඉටු කිරීමට යොදා ගනු ලබන උපක්‍රම, ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය කරමින් සකස් කර නොතිබු බැවින් එය අසම්පූර්ණ සංයුක්ත සැලැස්මක් බව නිරීක්ෂණය විය. | 2021-2025 වර්ෂයට අදාළ සංයුක්ත සැලැස්ම 2020 වර්ෂයේදී සකස් කර ඇත. 2021 වර්ෂය වනවිට අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු හා උපාධිධාරී අභ්‍යාසලාභීන් 02 කු පමණක් සේවයේ යෙදී සිට ඇත. එබැවින් ආයතනයේ කාර්යභාරය ආයතනය සතු ශක්‍යතා, දුර්වලතා, අවස්ථා හා තර්ජන හඳුනා ගනිමින් ඊට අදාළ උපාය මාර්ග ප්‍රවේශයන් ඇතුලත් කරමින් විශ්ලේෂණාත්මක සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට ප්‍රායෝගිකව අවස්ථාවක් ලැබී නොමැති බව පෙනී යන නමුත් අධිකාරිය විසින් මේ වනවිට (2025-2029) සඳහා එවැනි විශ්ලේෂණාත්මක සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට කටයුතු කර ඇත. | අධිකාරියේ අරමුණු හා කාර්යයන් ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාරවල ආයතනික පාලනය සඳහා වන මාර්ගෝපදේශයේ 2.3 වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් ආයතනයේ අරමුණ හා කාර්යයන් ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් අධිකාරිය විසින් 2024 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුළ වතු ප්‍රජාව සඳහා හිමිකම් ඔප්පු ප්‍රදානය කිරීම සහ වතු නිවාස පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීම යන කාර්යය හැර පනතේ වෙනත් කිසිදු කාර්යයක් ආවරණය වන පරිදි එම සැලැස්ම සකස්කර නොතිබුණි. | අධිකාරිය මගින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකිරීම පිණිස 2024 වර්ෂයේදී ප්‍රතිපාදන වෙන්ව තිබුණේ ජනාධිපති ලේකම් කාර්යාල වැය විෂයය යටතේ වෙන් වූ රු.මිලියන 22.4ක් හා නිවාස සංගණනයන් සඳහා අමාත්‍යාංශය වෙන් කළ රු.මිලියන 2 ක් පමණක් වීම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්ව ඇත්තේ එම කාර්යයන් 02 ක පමණි. | අධිකාරියේ අරමුණු හා කාර්යයන් ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුය. |
| (ආ) | 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් විය යුතු අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වර්ෂය සඳහා අයවැය ලේඛනය, වර්ෂය තුළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම, ක්‍රියාත්මක කාල රාමුව හා ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම්/ප්‍රතිඵල ප්‍රධාන ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදිය ඇතුළත්වන පරිදි 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා ආයතනය සඳහා සංවිධාන ව්‍යුහයක් , අයවැය ලේඛනයක්, අනුමත ක්‍රියාකාරි සැලැස්මක්, ක්‍රියාත්මක කාල රාමුව හා ක්‍රියාකාරකම් වල අපේක්ෂිත නිමවුම් හා අක් මුදල් අවශ්‍යතා සැලැස්මක් ඇත. නමුත් අධිකාරියට අභ්‍යන්තර විගණන අංශයක් නොමැති නිසා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් අධිකාරියේ අභ්‍යන්තර විගණනය සිදු කරයි. අමාත්‍යාංශයේ විගණන සැලැස්ම මගින් මෙම කාර්යය ආවරණය කරනු ලැබේ. | චක්‍රලේඛය අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව නිවාස සංගණනයක් සිදු කිරීමට අදාලව ක්‍රියාකාරකම් 4ක් හඳුනාගෙන තිබුණි. දිස්ත්‍රික් 7කට අදාල ප්‍රතිලාභී පවුල් 12000 දත්ත එකතු කිරීමට අපේක්ෂා කර තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විට දත්ත | මෙම දත්ත සමීක්ෂණය නිවාසලාභීන් සඳහා ඔප්පු සකස් කිරීම ක්‍රියාත්මක වුවක් බැවින් හා ඒ සඳහා ප්‍රජාව දැනුවත් කිරීමට | ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය |

| | | |
|---|---|---|
| එකතු කිරීමේ ආකෘතිය සහ දත්ත එකතු කිරීමට අදාළව කෑගල්ල, මාතර, කළුතර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක වල නිලධාරී පුහුණු කිරීම පමණක් සිදු කර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව අදාළ කාර්යයෙහි භෞතික ප්‍රගතිය සියයට 10ක් වූ අතර අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වතුවලට යාමට සිදුවේ. එම කාලය තුළ මැතිවරණ ප්‍රකාශයට පත්කර තිබූ බැවින් මැතිවරණ චක්‍රලේඛ අනුගතව වැඩසටහන ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීමට සිදුවීම තුළ එම ප්‍රතිපාදන අපේක්ෂිත පරිදි උපයෝජනය කිරීමට අවස්ථාවක් නොලැබුණි. එසේ වුවත් 2024 දෙසැම්බර් සිට එම කාර්ය නැවත ආරම්භ කර 2025 ක්‍රියාකාරී සැලැස්ම ඇතුළත් කර ක්‍රියාවට නංවනු ලැබේ. | |

## 4.3 විගණන කමිටු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමග ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාරවල ආයතනික පාලනය සඳහා වන මාර්ගෝපදේශයේ 4.2 වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් අවම වශයෙන් තුන් මසකට වරක් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සිදු කළ යුතු වුවද, 2022 හා 2023 වර්ෂවලදීත්, 2025 ජනවාරි 01 දින සිට 2025 අගෝස්තු 31 දින දක්වාත් කිසිදු රැස්වීමක් පැවැත්වීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන තනතුරක් හෝ අධිකාරිය සතුව විගණන නිලධාරියෙකු නොමැති බැවින් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය හරහා එම කාර්යය ඉටු කර ගැනීමට අමාත්‍යාංශ ලේකම් වෙත දැනුවත් කිරීම් කර ඇත. අමාත්‍යාංශය මගින් ත්‍රෛමාසිකව පවත්වනු ලබන විගණන කළමණාකරණ කමිටු හරහා අදාළ විගණනය දැනටමත් සිදු කරනු ලබයි. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන සැලැස්මට මෙම අධිකාරිය ඇතුලත් කර ඇත. | චක්‍රලේඛය අනුව සෑම මාස තුනකට වරක් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2030 වන විට සිය සංවිධානයට අයත් සියලුම රටවල | අධිකාරිය වෙත පැවරී ඇති කාර්යභාරය හා අරමුණු | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට |

ආර්ථික වර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී තිබුණු අතර ඊට ගැලපෙන පරිදි අපේක්ෂිත අරමුණු හඳුනාගත යුතු වුවද, අධිකාරිය විසින් අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන නොතිබුණු අතර එම අරමුණු ළඟාකර ගැනීම සඳහා නිවැරදි දත්ත ලබාගැනීමේ සහ භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් නිශ්චිතව හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට ගත වූ වසර 05 ක කාලය තුළ අසමත් වී තිබුණි.

අනුව වතු ප්‍රජාවගේ දිළිඳුකම පිටු දැකීම මූලික තිරසර ඉලක්ක වශයෙන් අධිකාරිය හඳුනාගෙන ඇත. වතුකරයේ දිළිඳුකම හා බැඳි ඇති ප්‍රධාන සාධක වශයෙන් කුටුම්භ ආදායම අවම වීම හෝ ප්‍රමාණවත් පහසුකම් සහිත වාසස්ථාන නොමැති වීම ඉවහල් වී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ඉලක්ක සකස් කිරීම සඳහා අවශ්‍ය දත්ත (basic line) ලබාගැනීම අධිකාරිය විසින් මේ විට ආරම්භ කර ඇත. අධිකාරිය මඟින් අපේක්ෂිත කටයුතු ඉටු කිරීම සඳහා අවම කාර්ය මණ්ඩලයක් හෝ මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර නොදීම මෙම ක්‍රියාවලිය ප්‍රමාද වීමට හේතු වී ඇත. මූල්‍ය ප්‍රතිපාදන බාහිර පාර්ශව හරහා ලබා ගැනීමට ක්‍රියා කළ හැකි බැවින් අවශ්‍ය මානව සම්පත ලබා ගැනීමට අනුමැතීන් ලැබෙන්නේ නම්, මෙම ප්‍රමාදය වළක්වා ගැනීමට හැකියාව ඇති බවද සඳහන් කරමි.

ගැලපෙන පරිදි අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන ක්‍රියාත්මක කළ යුතු වේ.